ඉද්දමල්ගොඩ, ඩයනා කුමාරි

වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Sustainability*

# පාසල් විෂය මාලාවට අනුගතව දෙවන භාෂාවක් වශයෙන් දෙමළ භාෂාව ඉගෙනීමේ දී මතුවන ගැටලු (හයවන ශ්‍රේණිය සඳහා වන විෂය නිර්දේශය ඇසුරින්)

හයවන ශ්‍රේණියේ විෂය නිර්දේශයට අදාළ සෙසු විෂයයන් සඳහා දක්ෂතාවයක් දක්වන ශිෂ්‍යයෝ ද දෙවන භාෂාවක් වශයෙන් දෙමළ ඉගෙනීමේ දී දුර්වලතා රැසක් පෙන්නුම් කරති. හයවන ශ්‍රේණියේ විෂය නිර්දේශය ඇසුරින් පාසල් විෂය මාලාවට අනුගතව දෙවන භාෂාවක් වශයෙන් දෙමළ භාෂාව ඉගෙනීමේ දී මතුවන ගැටලු සහ දෙමළ ඉගෙනීමේ දී දරුවන් පෙන්වන දුර්වලතා සහ ඒවාට හේතු කවරේදැයි යන්න විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණයි.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය කලාපයට අයත් පාසල් 03ක් තෝරාගෙන එකී පාසල්වල හයවන ශ්‍රේණියේ පන්ති 04ක ශිෂ්‍යයන් 60කට ආසන්න සංඛ්‍යාවක් මෙම පර්යේෂණය සඳහා තෝරා ගැනින. දෙමළ භාෂාව සඳහා උපකාරක පන්තිවලට සහභාගි වන සහ උපකාරක පන්තිවලට සහභාගි නොවන යනුවෙන් කණ්ඩායම් දෙකකට වර්ග කෙරිනි. එම ශිෂ්‍යයනට ඔවුන්ගේ පාඨ ග්‍රන්ථය ඇසුරින් සකසා ගත් ප්‍රශ්න පත්‍රයක් සහ ප්‍රශ්නාවලියක් ලබා දීමෙන් ද, ඔවුන් සමග පෞද්ගලිකව පවත්වන ලද සාකච්ඡා මගින් ද ලබා ගත් දත්ත විග්‍රහත්මක වාග්විද්‍යාවේ එන සිද්ධාන්තයනට අනුව විග්‍රහ කෙරින. මෙම දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගත් ශිෂ්‍යයන්ගේ දුර්වලතා මෙසේ දැක්විය හැකියි.

- අකුරු හඳුනා ගැනීමේ දී සහ ලිවීමේදී දක්වන දුර්වලතා
- ශබ්ද භේදය පිළිබඳ අවබෝධයක් නොතිබීම හේතුවෙන් උච්චාරණයෙහි නිරවද්‍ය භාවයක් නොතිබීම
- නව වාක්‍ය නිර්මාණය කිරීමට හෝ එවැනි වාක්‍ය තේරුම් ගැනීමට නොහැකි වීම (පෙළපොතේ දී ඇති මාතෘකාවකින් වුවද රචනාවක් ලිවීමේ හැකියාවක් නොදැක්වීම)
- භාෂා ද්වීරූපතාවක් ඇති භාෂාවක් වශයෙන් දෙමළ භාෂාවේ භාෂණය සහ ලේඛනය යන අංශ දෙකක් ඇති බව නොදැනීම සහ කෙටි වාක්‍යයක් වුවද නිර්මාණය කරමින් කතාබහ කිරීමේ හැකියාවක් නොමැති වීම

මෙම පර්යේෂණයට අනුව පෙනී යන්නේ දෙමළ භාෂාව දෙවන භාෂාවක් වශයෙන් විධිමත්ව ඉගැන්වීම ආරම්භ කෙරෙන හය වසර විෂය නිර්දේශය දෙවන භාෂාවක් උගනින ශිෂ්‍යයකු තුළ වර්ධනය කළ යුතු කථනය, අසා තේරුම් ගැනීම, කියවීම සහ ලේඛනය යන භාෂා කුශලතාවන් කිසිවක් වර්ධනය කිරීමෙහි ලා අපොහොසත් ව ඇති බවයි. එකී කුශලතාවයන් වර්ධනය කළ හැකි ආකාරයට මෙම විෂය නිර්දේශය සංශෝධනය විය යුතු බවත්, එකී විෂය නිර්දේශයෙහි කථනය ඉගැන්වීම සඳහා වැඩි අවකාශයක් ලබා දිය යුතු බවත්, දෙවන භාෂාවක් වශයෙන් දෙමළ ඉගැන්වීමේ හැකියාවක් ඇති පළපුරුදු ආචාර්යවරුන් දෙමළ ඉගැන්වීම කළ යුතු බවත් හේදී එළඹි නිගමනයයි.